ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.

කළමනාකරණ අධ්‍යයනවේදී උපාධි වැඩ සටහන

4 වන මට්ටම අවසාන පරීක්ෂණය 2008

**MCU 2208 -** මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල

කාලය - පැය 03 යි.

---

දිනය - 2008 පෙබරවාරි 09 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

සෑම ප්‍රශ්නයකටම ලකුණු 20 කි.

01. (අ) අර්ථ ක්‍රමයක් තුල කොටස් වෙළඳපොලෙහි කාර්යභාරය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 12)

(ආ) මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල පිළිබඳව හදාරා ඇති ශිෂ්‍යයකු ලෙස, කොළඹ කොටස් වෙළඳපලට දේශීය ආයෝජන ඉහළ නැංවීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග 08 ක් යෝජනා කරන්න.

(ලකුණු 08)

02. (අ) මුදල් හා ප්‍රාග්ධන වෙළඳපලෙහි භාවිතාවන කෙටි කාලීන හා දිගුකාලීන ආයෝජන උපකරණ වෙන් වෙන්ව දක්වන්න.

(ලකුණු 10)

(ආ) මුදල් වෙළඳපලෙහි ඉහළ පොළී අනුපාතයන් වාණිජ බැංකුවල කාර්‍යඵලය සඳහා ඇති කරන බලපෑම විශ්ලේෂණය කරන්න.

(ලකුණු 10)

03. (අ) ඔබගේ මිතුරකු කොළඹ කොටස් වෙළඳ පලෙහි ආයෝජනය කිරීමට තීරණය කර ඇති බව උපකල්පනය කරන්න. ඔහු/ඇය කොටස් වෙළඳ පලෙහි ආයෝජනය කිරීමේදී අනුගමනය කළයුතු පියවරයන් කවරේදැයි උපදෙස් දෙන්න.

(ලකුණු 12)

(ආ) අර්ථ ක්‍රමයක් තුළ කල්බඳු සමාගම්වල කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

04. (අ) මධ්‍යගත තැන්පතු ක්‍රමය (CDS) ලෙස ඔබ අදහස් කරන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) කොටස් වෙළඳපල තැරැව්කාර සමාගමක කාර්‍යභාරය පැහැදිළි කරන්න.

(ලකුණු 07)

(ඇ) කොටස් වෙළඳපල තැරැව්කාර සමාගම් 5 ක් ලැයිස්තු ගත කරන්න.

(ලකුණු 05)

05. (අ) ඉතිරි පරිණත කාලය වසර 4 ක් වන 14% රු.100/- භාණ්ඩාගාර බැඳුම්කරයක විකුණුම් මිල රු. 94/- කි. මෙහි පරිණත කාලයට ඵලදාව ගණනය කරන්න.

(ලකුණු 06)

(ආ) සී/ස, ABC සමාගම සීඝ්‍ර වර්ධන අවධියක් පසු කරමින් සිටී. ඉදිරි වර්ෂ තුන තුල ඉපැයීම් සහ ලාභාංශ සඳහා 18% ක වර්ධනයක් අපේක්ෂා කරන අතර, ඉන්පසු එය 6% ක ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරාවි යැයි බලාපොරොත්තුවේ. සී/ස, ABC සමාගමේ අවසාන ලාභාංශය, කොටසකට රු 1.15 ක් වන අතර එහි අපේක්ෂා කරන ඵලදා අනුපාතය 18% කි. ඔබ විසින් සමාගමේ කොටසක වර්තමාන මිල ගණනය කල යුතුය.

(ලකුණු 14)

06. අදහස සහ සංකල්ප පැහැදිලි කරමින් පහත සඳහන් මාතෘකා පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව (SEC)

(ආ) කොටස් වෙළඳපළ දර්ශක

(ඇ) ප්‍රාථමික නිකුතුව සහ ද්විතියික නිකුතුව

(ඈ) ණය ශ්‍රේණිගත කිරීම

(ඉ) ක්ෂුද්‍ර මූල්‍යකරණය (Micro financing)

(ලකුණු 4 x 5)

- හිමිකම් ඇවිරිණි. -